**සබරගමුව පළාත් සභාව - 2018**

**-----------------------------------**

# 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

## 1.1 තත්වාගණනය කළ මතය

**----------------------------**

සබරගමුව පළාත් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උප වගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින නිකුත් කරන ලද අතර, ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාරව විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූලි 26 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට සබරගමුව පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

**------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමණාකාරිත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සබරගමුව පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු වේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේ දි ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතු ය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය සැලකිල්ලට ගන්නා නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම,

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ වත්කම් කළමනාකරණ පද්ධතිය අනුව ජංගම නොවන වත්කම් වටිනාකම රු.4,434,085,495 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.2,667,260,162 ක් ලෙස දැක්වීම හේතුවෙන් ජංගම නොවන වත්කම් රු.1,766,825,333 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | සියළුම ජංගම නොවන වත්කම් මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කළයුතු වේ. | ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර ඇත්තේ සිගාස් වැඩසටහනට ඇතුළත් කර ඇති වත්කම් පමණි. |

### 1.6.2 අනුකූල නොවීම්

#### 1.6.2.1 නීති රීති , රෙගුලාසි හා කළමණාකරන තීරණවලට අනුකූල නොවීම

| | නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (8), (9) වගන්ති | විගණකාධිපති විසින් 2006 වර්ෂයේ නිකුත් කළ අධිභාර සහතික 02 කට අදාල එකතුව රු.1,272,321 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන්වන විටද කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වේ. | මාවනැල්ල ප්‍රාදේශීය සභාවට අයත් රු. 1,250,000 වටිනා අධිභාරය සඳහා අධිභාරකරුවකු අභියාචනා කර ඇත. කෑගල්ල ප්‍රාදේශීය සභාවට අයත් රු. 22,321 වටිනා අධිභාරයට සම්බන්ධව පැවරූ නඩුව නිෂ්ප්‍රභා වී ඇත. නැවත එම නඩු පැවරීමට කටයුතු සූදානම් කරමින් පවතී. |
| (ආ) | සබරගමුව පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහය | | | |
| (i) | ප.මු.රී.54 | පළාත් සභාවේ අමාත්‍යාංශ 03 ක සහ ආයතන 02 ක සිදු වී තිබු අනතුරු 48 කට අදාලව රු.10,505,218 ක පාඩු සම්බන්ධයෙන් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පළාත් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් කඩිනමින් පරීක්ෂණ කර අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | ප.මු.රි. 117.1 | රෝහල් 05 කට අදාලව එකතු කරන ලද මාසික ආපනශාලා ආදායම පළාත් සභා ආදායමට බැර කිරිමට කටයුතු නොකර රෝහල්වල වෙනම ගිණුමක තැන්පත් කර තිබුණ අතර, සමාලෝචිත වර්ෂය අවසානයට එම ගිණුම්වල ශේෂ එකතුව රු.7,729,222 ක් විය. ඇඹිලිපිටිය මූලික රෝහල විසින් එම ආදායම්වලින් අනුමැතියකින් තොරව වියදම් කර තිබුණි. | මුල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ආපන ශාලා වලින් ලැබෙන කුලී ආදායම එක් එක් රෝහල යටතේ ඇති ආපනශාලා ආදායම් ගිණුමට බැර කරනු ලබන අතර, එම අරමුදලේ මුදල් රෝහලේ සංවර්ධන කටයුතු වලටත්, හදිසි සහ අත්‍යවශ්‍ය භාණ්ඩ මිල දී ගැනීම්වලටත් පමණක් දැනට යොදවා ගනු ලැබේ. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ.571 | 2018 දෙසැම්බර් 31 දිනට ආයතන 05 කට අයත් රු.64,929,146 ක් වූ තැන්පතු 184 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | තැන්පතු කිහිපයක් රාජ්‍ය ආදායමට බැර කර ඇති අතර ඉතිරිය කඩිනමින් බැර කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | 2007 මැයි 11 දිනැති අංක 09/2007, 2017 ඔක්තෝබර් 13 දිනැති අංක 27/2017 හා 2018 පෙබරවාරි 20 දිනැති අංක 03/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | 2014 මැයි 02 සිට 2018 ඔක්තෝබර් 02 දින දක්වා පළාත් සභාවේ අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන නිලධාරියෙකු වෙත එකතුව රු.652,662 ක දීමනා, සහ හිඟ වැටුප් ගෙවා තිබුණි. | චක්‍රලේඛ විධි විධානයන්ට පටහැනිව සිදුකරන ලද ගෙවීම් ආපසු අයකල යුතු වේ. | අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ ලෙස කටයුතු කළ අය වෙත අදාළ මුදල් රජයට බැර කරන ලෙස දැනුම් දී ඇත. |
| (ඈ) | 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2 වගන්තිය | ප්‍රජාපාදක සංවිධානයක් නොවන සංගමයකට පළාත් මාර්ග අමාත්‍යාංශයේ රු.3,795,738 ක් වූ කර්මාන්ත 02 ක් පිරිනැමීමට බලංගොඩ විධායක ඉංජිනේරු කාර්යාලය විසින් කටයුතු කර තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී සොයා බලා පිළිතුරු ඉදිරිපත් කරමි. |

## 2. ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් අයකර ගත යුතු ඉඩම් බදු ආදායම රු.13,442,234 ක් විය. | මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉඩම් බදු රැස්කිරීම සම්බන්ධව ගිණුම් තැබීම මුදල් පදනම මත සිදුකර ඇත. ඉදිරියේදී උපචිත පදනම යටතේ ආදායම් රැස්කිරීම ගිණුම්ගත කිරීමට සැලසුම් කර ඇත. එහිදී හිඟ ආදායම් රැස්කිරීම පිළිබඳ වාර්තා කිරීමට හැකිවේයැයි අපේක්ෂා කරමි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු.1,575,207,635 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.123,644,491 ක් විය.

## 4. ප්‍රඥප්ති ගිණුම්, අරමුදල් හා වාණිජ අත්තිකාරම් ගිණුම්

### 4.1 ප්‍රඥප්ති ගිණුම්/අරමුදල් ගිණුම්

(අ) සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ අදහස් |
|---|---|---|---|
| (i.) | බලපත්‍ර ලබා නොගෙන වසර ගණනාවක සිට අනවසරයෙන් ධාවනය වන බස්රථ පිළිබඳ තොරතුරු අනාවරණය කර ගැනීමට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය අසමත් වී තිබුණි. | ධාවන බලපත්‍ර ලබානොගෙන ධාවනය වන බස්රථ පිළිබඳ තොරතුරු අනාවරණය කරගැනිමට කටයුතු කර ඒ සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතු වේ. | මාසික දඩ අයකිරීමේ ප්‍රවණතාවක් ඇත. |
| (ii.) | 2016 හා 2017 වර්ෂවල ආයතන අරමුණුවලට පටහැනිව අවස්ථා 03 ක දී එකතුව රු.2,312,250 ක් ගෙවා තිබුණි. | අරමුණුවලට පටහැනිව ගෙවීම් සිදු නොකළ යුතු වේ. | පිළිගනිමි. පූර්වාදර්ශයක් ලෙස ගෙවා ඇත. |
| (iii.) | රත්නපුර - ඇඹිලිපිටිය මාර්ග බලපත්‍රයක් ලබා දීම සඳහා පුද්ගලයෙකුට රු.2,000,000 ක ටෙන්ඩරයක් පිරිනමා තිබුණ ද, මෙම මාර්ගය සඳහා මාර්ග බලපත්‍රයක් | විනිවිදභාවයකින් යුතුව ක්‍රියා කිරීමට කටයුතු කළ යුතු අතර, නිශ්චිත ක්‍රමවේදයකට අනුව මාර්ග බලපත්‍ර ලබා දිය යුතු වේ. | පිළිගනිමි. එන්තරවාසියට අදාලව ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර නොමැත. |

| | | | |
|---|---|---|---|
| | තිබෙන බවට වෙනත් පුද්ගලයෙකු එන්තරවාසියක් ඉදිරිපත් කර තිබීම නිසා ටෙන්ඩරය ප්‍රදානය කරන ලද බලපත්‍රය වෙනුවෙන් මුදල් ලබාගෙන නොතිබුණි. | | |
| (iv.) | අධිකාරිය විසින් 2015 වර්ෂයේ රු.3,441,110 ක් වැයකර මිලදීගෙන තිබුණු ආරක්ෂිත කැමරා පද්ධතිය 2019 මැයි 06 දින වනවිටත් නිෂ්ක්‍රියව පැවතුණි. | අදාල උපකරණ ප්‍රයෝජනයට ගත යුතු වේ. | පිළිගනිමි. |

(ආ) ඉපැරණිගම තේමා උද්‍යානය අධිකාරිය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනතේ 16 වන වගන්තිය හා 1982 අංක 03 දරන සංශෝධිත පනතේ 27 වන වගන්තිය සහ 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 10 හා 16 වැනි වගන්ති ප්‍රකාරව නියමිත පරිදි දායක මුදල් නොගෙවීම මත සමාලෝචිත වර්ෂයේදී පිළිවෙළින් රු.42,722 ක හා රු.318,868 ක අධිභාර ගෙවීමට සිදු වී තිබුණි. | පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මූල්‍ය අර්බුදය නිසා සේවක භාරකාර අරමුදලේ මෙන්ම සේවක අර්ථ සාධක අරමුදලේ දායක මුදල් ගෙවීමට අපොහොසත් වී ඇත. මේ වන විට හිඟ මුදල් සහ සියළුම අධිභාර මුදල් ගෙවීමට කටයුතු කර ඇත. |

(ඇ) හදිසි අවස්ථා අරමුදල

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 20(3) වගන්තියට අනුව සබරගමුව පළාත් හදිසි අවස්ථා අරමුදල සඳහා ආණ්ඩුකාරවරයා විසින් රීති සාදා නොතිබුණු අතර, අරමුදල පිහිටුවා වර්ෂ 28 ක් ඉක්මගොස් තිබුණ ද කිසිදු අවස්ථාවක අරමුදල උපයෝජනය කර නොතිබුණි. | පළාත් සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, අරමුදල පිහිටුවීමේ අරමුණ ඉටු විය යුතු වේ. | අරමුදලට අදාල රීති කෙටුම්පත් සකස් කර ඇති අතර, ඉදිරියේ දි ගරු ආණ්ඩුකාරතුමාගේ අවධානය යොමුකර එතුමාගේ නියෝග හා අනුමැතිය අනුව රීති සම්පාදනය කරනු ලැබේ. හදිසි ව්‍යසන තත්ත්ව ඇති වූ අවස්ථාවල සමාජ සේවා අමාත්‍යාංශය හා සමාජ සේවා අරමුදල මගින් සහ ගරු ආණ්ඩුකාරතුමාගේ සුභ සාධන වැඩ සටහන් සඳහා වූ වැය විෂයයේ ප්‍රතිපාදන මගින් වියදම් දරා තිබුණි. |

### (ඇ) සබරගමුව පළාත් සමාජ සේවා අරමුදල

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| ( i.) | අවශ්‍යතාවය හඳුනාගැනීමකින් තොරව සමාජ සේවා අරමුදල යටතේ ශ්‍රවණාබාධිත පුද්ගලයින්ට බෙදා හැරීම සඳහා මිල දී ගෙන තිබුණ රු. 5,840,000 ක් වටිනා ශ්‍රවණ උපකරණ 400 ක් ගබඩාවට ලැබුනු 2018 ජුනි 20 දිනම සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත නිකුත් කළ බවට තොග ලේඛනයේ සටහන් තබා තිබුණ ද 2019 මැයි 14 දින සිදුකළ තොග භෞතික පරීක්ෂාවට අනුව රු. 411,700 ක් වටිනා අධිබලැති ශ්‍රවණ උපකරණ 23 ක් කාර්යාල ගබඩාවේ හා රු.1,147,500 ක් වටිනා මධ්‍යම බලැති ශ්‍රවණ උපකරණ 85 ක් සැපයුම් ආයතනයේ තිබුණි. | වඩාත් පහසු හා සහනදායී ආකාරයට ප්‍රතිලාභීන්ට උපකරණ ලබා ගැනීමට හැකිවන ආකාරයට නිසි ක්‍රමවේදයක් සකස් කිරීමටත් උපකරණ ඉක්මනින් ප්‍රතිලාභීන්ට ලබා දීමටත් කටයුතු කල යුතු වේ. | ශ්‍රවණ උපකරණ ප්‍රතිලාභීන් වෙත ලබා දීමට ප්‍රථම එක් එක් පුද්ගලයාට ගැළපෙන පරිදි වෙන වෙනම කනට අච්චුවක් සකස් කළ යුතු වේ. ශ්‍රවණ උපකරණ බෙදාහැර තව දුරටත් ඉතිරිව තිබූ සාමාන්‍ය ශ්‍රවණ උපකරණ 85 ක් හා අධිබල ශ්‍රවණ උපකරණ 23 ක් බෙදාහැරීමේ කාර්යයන් 2019 අප්‍රේල් මස අග භාගයේ යොදාගෙන තිබූ අතර ඒ දිනවල රටේ ඇතිවූ අයහපත් ගැටුම්කාරී වාතාවරණය නිසා එය ඉටුකළ නොහැකි විය. |
| ii. | සමාලෝචිත වර්ෂයේ අවසානයට අරමුදලේ ශේෂය රු.54,399,734 ක් වුවද පනතේ 24 වන වගන්තිය ප්‍රකාරව කිසිඳු ආධාරයක් නොලබන අසරණ පවුල් හඳුනාගෙන ආධාර ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර නොතිබුණි. | අරමුදලේ අදාල වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | සමාජ සේවා අරමුදල ජංගම ගිණුමේ මුදල් ශේෂය ප්‍රමාණවත් නොවන අවස්ථා වලදී පොලී මුදල් ජංගම ගිණුමට මාරු කර ආධාර ලබා දීමට කටයුතු කෙරේ.<br>සමාජ සේවා අරමුදලේ භාරකාර මණ්ඩලයේ සභාපති තනතුරෙහි කටයුතු කරන නව ලේකම්ගේ ප්‍රධානත්වයෙන් භාරකාර මණ්ඩලය රැස්වූයේ 2018.12.31 බැවින් 2019 වර්ෂයේදී එම අයදුම්පත්වලට ගෙවීම් සිදු කර ඇත. |

### 4.2 වාණිජ අත්තිකාරම් ගිණුම්

**උඩුගොඩ සත්ත්ව පාලන සංවර්ධන සහ පුහුණු මධ්‍යස්ථාන වාණිජ අත්තිකාරම් ගිණුම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ප්‍රධන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සත්ත්ව පාලන සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානයට 2011 වර්ෂයේදී නොමිලයේ ලබාදි තිබූ එකතු පිරිවැය | වත්කම් ඵලදායීව උපයෝජනය කළ යුතු වේ. | ඉදිරියේදී සුදුසු ප්‍රතිලාභීන් වෙත ලබා දීමට යෝජනා කර ඇත. |

රු. 5,638,278 ක් වූ සත්ත්ව ආහාර සැකසුම් යන්ත්‍ර දෙකක් 2019 මැයි 21 වන විටත් නිෂ්කාර්යව පැවතුණි.

## 5. මෙහෙයුම් සමාලෝචනය

### 5.1 කාර්ය සාධනය

**රජයේ ප්‍රදාන**

පළාත් සභා සංවර්ධන වැඩ යෝජනා සඳහා ලැබී තිබූ ප්‍රතිපාදනයන් සහ උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | මූලාශ්‍රය | අනුමත මුදල | වැයකළ මුදල | ඌණ උපයෝජනය |
|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| (අ) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) | 2,630.84 | 1,951.37 | - |
| (ආ) | පළාත් සංවර්ධන ප්‍රදාන (PDG) | 688.84 | * | - |
| (ඇ) | උපමාන පාදක ප්‍රදාන (CBG) | 454 | 460.50 | - |
| (ඈ) | විශේෂ අංශ සංවර්ධන ව්‍යාපෘති ප්‍රදාන (අධ්‍යාපන) | 162.05 | 113.60 | 48.45 |
| (ඉ) | විශේෂ අංශ සංවර්ධන ව්‍යාපෘති ප්‍රදාන (සෞඛ්‍ය) | 324.80 | 323.52 | 1.28 |
| | | 4,260.53 | 2,848.99 | 49.73 |

* පළාත් සංවර්ධන ප්‍රදානවලට (PDG) අදාල වියදම (PSDG) හා (CBG) වියදම් තුල ඇතුලත් වේ.

### 5.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රධාන අමාත්‍යාංශයේ සරණ සෙවන නිවාස සංවර්ධන වැඩසටහන මගින් අඩු ආදායම් ලාභී නොවන පුද්ගලයන් තිදෙනෙකුට මූල්‍ය ආධාර ලබා දී තිබුණි. | මෙම වැඩසටහනෙහි අරමුණු ඉටුවන ආකාරයට කටයුතු කළ යුතු වේ. | වහලය සම්පූර්ණයෙන් දිරාපත්වී තිබුණ එක් නිවසක් සඳහා පළමු වාරිකය ලබා දීමෙන් පසු දරුවන්ගේ ආදායමින් නිවස වැඩිදියුණු කර ඇත. කිසිදු රැකියාවක් නොකරන සාමාජිකයන් පස් දෙනෙකු සිටින අනෙක් නිවසෙහි කපරාරු කර ගෙබිම සිමෙන්ති දමා දොර ජනෙල් සවිකර නොතිබුණි. කොටසක ලෑලි හා, |

| | | | |
|---|---|---|---|
| | | | කොටසක කටුමැටි සහිත වහලයට ටකරන් සෙවිලිකර තිබුණු ඉතිරි නිවස සඳහා පළමු වාරිකය නිර්දේශ කලෙමි. සමාලෝචනය කර ඉදිරි වාරික ගෙවීම පිළිබඳව තීරණ ගනිමි. |
| (ආ) | පළාත් රෝහල් පහක හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල තුනක ඖෂධ භෞතික පරීක්ෂාවේදී අනාවරණය වු ඖෂධ වර්ග 48 කට අයත් ඖෂධ ඒකක 22,572 ක අතිරික්තයක් හා ඖෂධ වර්ග 47 කට අදාලව ඒකක 683,244 ක ඌණතාවයක් සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කර නොතිබුණි. | ඖෂධ තොග ලේඛන නිවැරදිව පවත්වා ගත යුතු වේ. | වෙනත් රෝහල්වලට නිකුත්කළ ඖෂධ ගබඩාව තුල පැවතීම. නිකුත්කළ ඖෂධ රැගෙන යාමට පෙර පොත්වලින් අඩු කිරීම නිසා අතිරික්තය ඇති වී ඇත. මෙම අතිරික්තය විගණිත දිනයෙන් පසු භාර දී ඇත. නිවැරදිව පොත් තුලනය කිරිමට උපදෙස් ලබා දී ඇත. |
| (ඇ) | ඇඹිලිපිටිය හා පුස්සැල්ල ආයුර්වේද රෝහල්වල හා පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යන වියළි හා නිමි ඖෂධ, තොග පොත් අනුව ශේෂ හා භෞතික තොග ශේෂ අතර පවතින පිළිවෙලින් ඖෂධ වර්ග 08 ක බෝතල් 75 ක් හා කිලෝග්‍රෑම් 36.650 ක අතිරික්තයක් සහ ඖෂධ වර්ග 22 ක බෝතල් 34 ක් හා කිලෝ ග්‍රෑම් 40.320 ක ඌනතාවයන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඖෂධ වල ඌනතා සහ අතිරික්තතා සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය කටයුතු සිදුකළ යුතු වේ. | ඇඹිලිපිටිය හා පුස්සැල්ල ආයුර්වේද රෝහල්වල හා පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් 2018.12.31දිනට භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකෙරෙමින් පවතින අතර ,එහිදී වාර්තා වන ඌනතා හා අතිරික්තතා සඳහා අවශ්‍ය ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| (ඈ) | සමුපකාර සංවර්ධන අරමුදල මගින් සමුපකාර සමිති වැඩි දියුණු කිරිමේ අරමුණින් 2007, 2009 හා 2010 වර්ෂවල දී කිරිඇල්ල, අරණායක හා කලවාන විවිධ සේවා සමිති වෙත ලබා දුන් ණය මුදලින් රු.3,223,436 ක් අය වීමට තිබුණි. | ණය අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | වාරික මුදලින් රු.1,776,564 ක් අයවී ඇති අතර අයවිය යුතු ඉතිරි මුදල රු.3,223,436 කි. |
| (ඉ) | කරවනැල්ල මූලික රෝහලෙහි පල්දෝරු පද්ධතියේ නිරාවරණය වු අපජල ටැංකි වර්ෂාවත් සමඟ උතුරා ජල මූලාශ්‍ර වලට මිශ්‍ර වන බැවින් එම පද්ධතිය විධිමත් කිරීමට ක්‍රියාකර නොතිබුණි. එසේම මෙම පල්දෝරු පද්ධතිය සඳහා පරිසර බලපත්‍රයක් ද ලබාගෙන නොතිබුණි. | පරිසර බලපත්‍රයක් ලබාගෙන එම පද්ධතිය විධිමත් කිරිමට කටයුතු කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් නැවත අදාල ආයතන දැනුවත් කර නව පද්ධතියක් ඉදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමි. |

## 5.3 දූෂ්‍ය අක්‍රමිකතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් මාර්ග අමාත්‍යාංශ ප්‍රතිපාදන මත කොළොන්න ප්‍රාදේශීය සභාවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කර තිබූ ක්‍රීඩා පිටි සංවර්ධන ව්‍යාපෘති 21 ක ගෙවීම් කරන ලද වැඩ විෂයයක් මගින් ආවරණය වී තිබූ අට්ටි ගසන ලද පස් ඇතිරීම යන වැඩ විෂයය අතිරේක වැඩ විෂයයක් ලෙසද ඇතුළත් කර පස් ඝණ මීටර් 38,872 ක් වෙනුවෙන් එකතුව රු. 5,928,010 ක් අධි ඇස්තමේන්තුගත කර ගෙවා තිබුණි. | ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතු අතර අලාභයන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | EW1-003 රේටයට අනුව අට්ටි ගසන ලද පස් ක්‍රීඩා පිටියේ ඇතිරීම සහ වතුර දමා රෝල භාවිතයෙන් තැලීම සඳහා දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටුවේ සේවාවන් සඳහා 2016 වර්ෂයේ මිල ගණන් ඇතුළත් කර සකස් කර ඇති විශ්ලේෂණ වාර්තාව අනුව පස් ඝණ මීටර් 01 ක් සඳහා රු. 483.08 ක් වැය වන බව දන්වා සිටිමි.EW1-002 හා EW1—003 යන විෂයන් දෙකම සඳහා වැයවී ඇත්තේ රු.439.70 කි. මෙම මුදල දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටුවේ විශ්ලේෂණ වාර්තාවෙන් සැකසූ මිලට වඩා අඩු වූ බැවින් රජයට මේ සම්බන්ධයෙන් පාඩුවක් සිදු වී නැත. |
| (ආ) | පළාත් මාර්ග අමාත්‍යාංශ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කර තිබූ ක්‍රීඩාපිටි සහ මාර්ග සංවර්ධන ව්‍යාපෘති 08 ක් සඳහා ඉටුනොකරන ලද වැඩ කොටස් වෙනුවෙන් එකතුව රු.1,094,609 ක් වැඩිපුර ගෙවා තිබුණි. | මූල්‍යමය අලාභයන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී සොයා බලා පිළිතුරු ඉදිරිපත් කරමි. |
| (ඇ) | ඕමල්පේ ප්‍රාදේශීය රෝහලේ ළමා, ළදරු හා මව් සායන ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාල බිල්පත් අනුව වැඩ විෂයයන් 03 ක් සඳහා එකතුව රු.103,364 ක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවන ලද මුදල අයකරගත යුතු වේ. | පිළිතුර ලැබී නැත. |

## 5.4 අවිධිමත් ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් මාර්ග අමාත්‍යාංශ ප්‍රතිපාදන මත කුරුවිට ප්‍රාදේශීය සභාවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කර 2016 දෙසැම්බර් 31 දින අවලංගු කර තිබූ පරකඩුව වටප්පිටිය අරුණළු වොලිබෝල් ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | විධිමත් අනුමැතියක් සහිතව ගෙවීම් කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී සොයා බලා පිළිතුරු ඉදිරිපත් කරමි. |

| | | | |
|---|---|---|---|
| | සඳහා 2018 අප්‍රේල් 02 දින රු. 1,339,115ක් ගෙවා තිබුණි. | | |
| (ආ) | බලංගොඩ විධායක ඉංජිනේරු කොට්ඨාශයේ සමාලෝචිත වර්ෂය තුලදී සිදුකල කි.මී. 42.7 ක මාර්ග නඩත්තු 10 කට අදාළ රු.9,379,069 ක වියදම් සනාථ කිරීම සඳහා කළ වැඩ බිල්පත්වලට අදාළ ප්‍රමාණපත්‍ර සඳහා මිනුම් වාර්තා පිළියෙල කර නොතිබුණි. | ප්‍රමාණවත් මුලාශ්‍ර ලේඛන ගෙවීම් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී සොයා බලා පිළිතුරු ඉදිරිපත් කරමි. |
| (ඇ) | සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ තනතුරු සඳහා පත්කිරීමේ බලධාරියා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වුවද පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ එවැනි තනතුරු 02ක් සඳහා අමාත්‍යාංශ ලේකම්වරයා විසින් 2014 ඔක්තෝබර් 24 දින පත්වීම් ප්‍රදානය සමඟ සේවයේ ස්ථිර කිරීම් ද සිදුකර එදින සිට 2018 දෙසැම්බර් 31 දක්වා එකතුව රු. 3,171,552 ක වැටුප් ගෙවා තිබුණි. | පත්වීම් බලධාරීයා විසින් බඳවා ගැනීමට කටයුතු කළයුතු වේ. | අනුමත කාර්ය මණ්ඩලය තුල මෙම පත්වීම් දෙක ලබාදී ඇත්තේ පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව යටතේ පවත්නා ඇඹිලිපිටිය මහවැලි ක්‍රීඩාංගණයට සහ රත්නපුර නව නගර ක්‍රීඩාංගණය සඳහා වූ කම්කරු තනතුරු දෙක සඳහාය. මෙම තනතුරු දෙකේ නිවැරදි නාමය විය යුතුව තිබුනේ Dept (දෙපාර්තමේන්තු ගත තනතුරු) යනුවෙනි. ඒ අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත අනුමත කාර්ය මණ්ඩලය නිවැරදිකර ගැනීම පිණිස යවා ඇත. |

## 5.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දිමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | බලංගොඩ විධායක ඉංජිනේරු කාර්යාලය මගින් අධීක්ෂණය කරන ලද බලංගොඩ මුලික රෝහල් පස් මහල් ගොඩනැගිල්ල ඉදිකිරිමට අදාලව ලබාගත් මිනුම් සමඟ ගෙවීම් බිල්පත් සැසඳීමේ දි වැඩ විෂයයන් 09 ක් සඳහා රු.3,651,276 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවා ඇති මුදල් අයකර ගත යුතු වේ. | සියලුම මිනුම් නැවත ලබා ගෙන විධිමත් පරිදි නැවත මිනුම් නිවැරදි කර වැඩිපුර යම් අයිතම සඳහා ගෙවීම්කර ඇත්නම් ඒවා අඩුකර අවසන් බිල්පත නිවැරදි කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ර/දෙහෙනකන්ද විද්‍යාලයේ ආරක්ෂිත බැම්ම ඉදි කිරීමේ කර්මාන්තයේ වැඩ 2016 සැප්තැම්බර් 04 දින අවසන් කිරීමෙන් පසු රු.900,242 ක් ගෙවා තිබුණ ද 2018 සැප්තැම්බර් 18 දින රත්නපුර කලාප අධ්‍යාපන කාර්යාලයේ කාර්මික නිලධාරී සමග මිනුම් ගැනීමේ දි රු.202,145 ක් වැඩිපුර ගෙවා තිබුණි. | පරීක්ෂාකර වැඩිපුර ගෙවා ඇති මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ස්ථානීය අවශ්‍යතාවය පරිදි බැම්මේ පළල අඩි 02 ක් වන කොටස 4'-6''පමණ උසකට හා දිගඅඩි 107 කට බැම්ම ඉදිකර ඇත. අතපසු වීමකින් ඒ වන විට ඉදිකරමින් තිබූ වෙනත් බැම්මක මිනුම් බිල්පතට ඇතුළත් වී ඇති නමුත් කිසිදු වැඩිපුර ගෙවීමක් සිදු වී නොමැත. |
| (ඇ) | ර/ඇඹි/පනාමුර මහා විද්‍යාලයේ ක්‍රීඩාගාරය වැඩි දියුණු කිරීමේ කොන්ත්‍රාත්තුවේ කළුගල් කඩා ඉවත් කිරීම වෙනුවෙන්, සබරගමුව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය මගින් ප්‍රකාශිත මාර්ග සම්මත මිල උපලේඛනය - 2016 සඳහන් වැරදි රේටයක් භාවිතා කර රු.136,495 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | පරීක්ෂාකර වැඩිපුර ගෙවා ඇති මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඇඹිලිපිටිය කලාප කාර්යාලය වෙත යොමු කර ඇත. පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරමි. |
| (ඈ) | ඇහැළියගොඩ කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලයේ සිදු කර තිබූ අළුත්වැඩියාවේ දී ඉටු නොකළ වැඩ වෙනුවෙන් හා ර/සුමන සමන් විද්‍යාලයේ ගුරු නිවස අලුත්වැඩියාව කිරීමේදී වැඩ විෂයන් 7 ක ඉටු නොකළ කාර්යයන් සඳහා එකතුව රු.209,220 ක මුදලක් ගෙවා තිබුණි. | පරීක්ෂාකර වැඩිපුර ගෙවා ඇති මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | රත්නපුර කලාප කාර්යාලය වෙත යොමු කර ඇත. පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරමි. |
| (ඉ) | කරවනැල්ල මූලික රෝහලේ පස්මහල් ගොඩනැඟිල්ල මාස 18 න් ඉදිකිරීම සඳහා 2015 ඔක්තෝබර් 16 දින රු.105,573,027 ක කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණු අතර, ගොඩනැගිල්ල 2018 දෙසැම්බර් 31 දින වන විටත් නිම කර භාර දී නොතිබුණි. | ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අද වන විට මෙහි ඉදිකිරීම් ඇනහිට ඇති අතර කිසිදු ප්‍රගතියක් නොමැත. ප්‍රමාදය පිළිබඳ ප්‍රධාන ලේකම් දැනුවත්කර ඇත. |

## 5.6 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

### 5.6.1 ප්‍රමාද වු ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ රු.5,700,000 ක් වටිනා ළමා ලොකු පුටු 3,000 ක් මිල දී ගැනීම සඳහා 2016 වර්ෂයේ පෞද්ගලික ආයතනයක් සමග ගිවිසුම්ගත වී තිබුණි. භාණ්ඩ භාර දිය යුතු අවසාන දිනය ගිවිසුමට ඇතුළත් කර නොතිබුණු නමුත් භාණ්ඩ පිරිවිතර ලේඛනයට අනුව 2017 පෙබරවාරි 15 දිනට පෙර භාණ්ඩ භාර දිය යුතුව තිබුණි. සති 27 ක ප්‍රමාදයකින් පසු භාණ්ඩ භාර දී තිබුණු අතර ගෙවීම් ප්‍රමාදවීම නිසා භාණ්ඩ සැපයීමේ ප්‍රමාද ගාස්තුව වූ රු.1,083,000 ක් අයකර ගැනීමට නොහැකිවී තිබුණි. | අදාළ සියළු කොන්දේසි ඇතුළත් කර ගිවිසුම් විධිමත්ව පිළියෙළ කර ඒ අනුව කටයුතු කළ යුතු වේ. | සැපයුම්කරු විසින් පුටු බෙදා හැරීම ර/ඇඹි/ඇඹිළිපිටිය කනිෂ්ඨ විද්‍යාලයෙන් 2017 ජුලි 14 දින ආරම්භ කර ඇති බව කාරුණිකව සඳහන් කරමි. සැපයුම්කරු වෙත ගෙවීමට ප්‍රමාණවත් අග්‍රිම නොලැබීම නිසා ගෙවීම සිදු කලේ 2018 ජනවාරි 25 දින වේ. ගෙවීම ප්‍රමාද වූ නිසා සැපයුම්කරුගෙන් ප්‍රමාද ගාස්තු අය කිරීමට නොහැකි වූ බව කාරුණිකව සඳහන් කරමි. |

### 5.6.2 අත්හැර දැමූ ව්‍යාපෘති

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් මාර්ග අමාත්‍යාංශය සමාලෝචිත වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර තිබූ ඇස්තමේන්තු ගත වියදම රු. 34,617,494 ක් වූ භූමි අලංකරණ සහ මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති 2 ක් ආරම්භකර නොතිබුණි. | හැකිතාක් සැලසුම්වලට අනුකූලව ව්‍යාපෘති ඉටුකළ යුතු වේ. | ලංසුකරුවන් තෝරා ගැනීමේ අපහසුව සහ කොන්ත්‍රාත් කරුවන් විසින් ඇස්තමේන්තු වැඩ වටිනාකම ඉක්මවා ලංසු ඉදිරිපත් කිරීමත් දෙපාර්තමේන්තු වැඩ වටිනාකමට කර්මාන්තය ක්‍රියාත්මක කිරීමට |

| | | | |
|---|---|---|---|
| | | | එකඟ නොවීමත් යන කරුණු මෙම ව්‍යාපෘති ආරම්භ නොකිරීමට හේතු විය. |
| (ආ) | ඉඩම් හා කෘෂිකර්ම අමාත්‍යාංශය සමාලෝචිත වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු වාරි ඇළ මාර්ග සංවර්ධන ව්‍යාපෘති 2 ක් ආරම්භකර නොතිබුණි. | හැකිතාක් වාර්ෂික සැලැස්මට අනුකූල වන පරිදි කටයුතු කළ යුතු වේ. | ඇපලාව රඹුක්පත කුඹුරු යායේ ඇළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ගොවීන්ගේ අකමැත්ත මත ඇති වූ ගැටළුකාරී තත්ත්ව නිසා අවලංගු කර ඇත. පරපේ වාරි ඇළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ඉටු කිරීම සඳහා කිසිදු ගොවි සංවිධානයක් ඉදිරිපත් නොවූ බැවින් අවලංගු කර ඇත. |

**5.6.3 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනිම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් මාර්ග අමාත්‍යාංශ ප්‍රතිපාදන මත ඇඹිලිපිටිය ප්‍රාදේශිය සභාවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරන ලද වැඩ වටිනාකම රු.1,970,667 ක් වූ පනාමුර පරෙවිකන්ද මාර්ගයේ දිග මීටර් 223 ක් කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතියේ වැඩ අවසන් කර වර්ෂ 1 ½ ක් ගතවීමට පෙර සම්පූර්ණ මාර්ගයේ කොන්ක්‍රීට් සඳහා යොදන ලද අඟල් ¾ ගල් මතු වී තිබීමත් මාර්ගයේ පාදම ප්‍රමිතිගතව ඉටු නොකිරීමෙන් මීටර් 43 ක කොටසක කොන්ක්‍රීට් ස්ථරයේ දික් අතට පැළුම් ඉරි මතු වී තිබුණි. | ව්‍යාපෘතිය ක්‍රියාත්මකවන අවස්ථාවේදී නිසි අධීක්ෂණයක් සිදුකල යුතු වේ. | මේ සම්බන්ධයෙන් අදාළ කොන්ත්‍රාත්කරු හා කාර්මික නිලධාරී දැනුවත්කර, කර්මාන්තයේ අඩුපාඩු කඩිනමින් නිවැරදි කරන ලෙස උපදෙස් ලබා දෙන ලදි. |
| (ආ) | සබරගමුව පළාත් මාර්ග අමාත්‍යාංශ ප්‍රතිපාදන මත රු.11,776,565 ක වැඩ | ව්‍යාපෘතිය ක්‍රියාත්මකවන අවස්ථාවේදී නිසි | කර්මාන්තයේ ඉදිකිරීම් කටයුතුවල |

| | | | |
|---|---|---|---|
| | වටිනාකමකට කුරුවිට හල්පේ ගොරක ඇල මාර්ගය කි.මී. 0.00 සිට කි.මී. 8.40 දක්වා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් කළ යුතු කාලය ඉක්මවා තිබුණු වන විට දින 487 ක් සඳහා ප්‍රමාද ගාස්තු රු.588,828 ක් අය විය යුතුව පැවතුණි. | අධීක්ෂණයක් සිදුකල යුතු අතර පාඩු පියවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රගතිය සියයට 65 ක් පමණ වේ. ගිවිසුම් කාලය තුල වැඩ අවසන් කර නොතිබුණු අතර විවිධ හේතුමත කල් ඉල්ලීම් සිදුකර ඇත. මාර්ග ප්‍රතිසංස්කරණය යටතේ මෙම මාර්ගයේ පාලම් 03 ක සුළු අළුත්වැඩියාවන් කිරීමට ඇස්තමේන්තුකර ඇත. කි.මී. 02 ස්ථානයේ පිහිටි පාලමේ ඇදි සවිකර ඇත. |
| (ඇ) | පළාත් මාර්ග අමාත්‍යාංශ ප්‍රතිපාදන මත බලංගොඩ විධායක ඉංජිනේරු කාර්යාලයේ අධීක්ෂණය යටතේ හුණුකොටුව සිට රජවක ගොඩකුඹුර හන්දිය දක්වා මාර්ගය වැඩි දියුණු කිරීමේ කර්මාන්තයේ දෙවන වර තාර ආලේපනයේදි වර්ග මීටර් 520 ක් සඳහා රු.57,980 ක් වැඩිපුර ගෙවා තිබු අතර මෙම අළුත්වැඩියාවන් සිදුකර මාස 15 ක් ගතවීමට පෙර වර්ග මීටර් 225 ක ප්‍රමාණයක තාර ආලේපය ගැලවී මාර්ග තලය දැඩි ලෙස අබලන්ව තිබුණි. | ව්‍යාපෘතිය ක්‍රියාත්මකවන අවස්ථාවේදී නිසි අධීක්ෂණයක් සිදුකල යුතු වේ. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී සොයා බලා පිළිතුරු ඉදිරිපත් කරමි. |
| (ඈ) | ඉඩම් හා කෘෂිකර්ම අමාත්‍යාංශ ප්‍රතිපාදන මත ඇඹිලිපිටිය නගර සභාවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කර තිබු ඉලුක්වෙල මාර්ගයේ කොන්ක්‍රීට් ඇතිරීමේ කර්මාන්තය වැඩ අවසන් කර මාස 14 ක් ගත වීමට පෙර කොන්ක්‍රීට් ඇතිරූ මාර්ගයෙන් මීටර් 31 ක කොටසක අඟල් ¾ ගල් මතුවී තිබුණි. | ව්‍යාපෘති සිදුකරනු ලබන අවස්ථාවේදී නිසි අධීක්ෂයක් සිදු කළ යුතු වේ. | මේ සම්බන්ධව ඇඹිලිපිටිය නගර සභාවෙන් විමසීමේදී රඹුකනගම එකමුතු ගොවි සංවිධානයට දැන්වීමෙන් පසුව කොන්ක්‍රීට් ඇතිරූ මාර්ගය මතුපිටින් නැවතත් කොන්ක්‍රීට් අතුරා සකස් කර ඇති බව දන්වා සිටින ලදී. කෙසේ වුවද එහි යෝග්‍යතාවය පිළිබඳව ගැටළුවක් ඇති හෙයින් ඒ පිළිබඳව අදාල කාර්මික නිලධාරී |

| | | | |
|---|---|---|---|
| | | | වෙතින් වාර්තාවක් හා එහි වර්තමාන තත්ත්වය ලබා ගැනීමට කටයුතු කර ඇත. |
| (ඉ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් 2017 ජුනි 07 දින ආරම්භ කරන ලද ඇස්තමේන්තු පිරිවැය රු. 35,899,000 ක් වූ කරපිංචා කෘෂි පුහුණු මධ්‍යස්ථානයේ යෝජිත නේවාසිකාගාර ගොඩනැගිල්ල ඉදිකිරීමේ 2 වන අදියර සඳහා රු.74,319,000 ක වැඩ ඇස්තමේන්තුවක් පිළියෙල කර 2018 ඔක්තෝබර් 01 දින සංවර්ධන නිර්මාණ යන්ත්‍රෝපකරණ අධිකාරිය වෙත යවා තිබූ නමුත් කොන්ත්‍රාත්කරුවන් නිසි පරිදි ඉදිකිරීම් සිදු නොකිරීමෙන් ගිවිසුම අවලංගු කර තිබුණි. මෙහි පළමු අදියර යටතේ ඉදිකර තිබූ කොටසද මෙතෙක් භාවිතයට ගෙන නොතිබිණි. | ඇස්තමේන්තුගත පිරිවැය ඉක්ම නොයන පරිදි කඩිනමින් ඉතිරි වැඩ අවසන් කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතු වේ. | සංවර්ධන නිර්මාණ යන්ත්‍රෝපකරණ අධිකාරිය විසින් 2018 දෙසැම්බර් 24 දින වනතෙක් එම ඉදි කිරීම් කටයුතු ආරම්භ නොකිරීම නිසා මෙම කර්මාන්තය අවලංගු කිරීමට තීරණය කර තිබුණි.විවෘත ටෙන්ඩර් පරිපාටිය යටතේ නැවත කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීමට කටයුතු කරමින් පවතී. |

5.6.4 ප්‍රමාණවත් පරිදි ඉටු නොකළ ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කුරුවිට හල්පේ සමගි මාවතට පානීය ජලය ලබා දීමේ ව්‍යාපෘති සඳහා රු.250,000 ක් වැයකර සවිකර තිබුණු ජල මෝටරය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විදුලි ධාරිතාවයන් ප්‍රදේශයේ නොමැති බැවින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ නොහැකි වී තිබුණි. | අපේක්ෂිත අරමුණු ඉටුවන ලෙස ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුයි. | මෙම කර්මාන්තය ගම් වාසීන්ගේ අවශ්‍යතාවයක් බැවින් මෙය ක්‍රියාත්මක කිරීම අනිවාර්යයෙන් කළ යුතුව ඇත. ඒ සඳහා දැනට පොදු ළිඳ අසලින් මෙම ට්‍රාන්ස්පෝමරය සවි කිරීමට කටයුතු කරන ලෙස විදුලිබල මණ්ඩලයට දන්වා යවා ඇත. |

## 5.7. වත්කම් කළමනාකරණය

### 5.7.1 නිශ්ක්‍රීය /ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් පිරිවැය රු. 550,000ක් වූ සියඹලාපිටිය අත්සළු ආයතනය සතු ඉඩම් හා ගොඩනැගිලි 2007 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණි . | ආයතනය සතු ඉඩම් හා ගොඩනැගිලි ඵලදායි කාර්යයන් සඳහා යොදා ගැනීම කළ යුතු වේ. | මෙය මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි ගොඩනැගිල්ලකි. මෙම ආයතනය 2007 වර්ෂයේදී කාර්මිකාවන් නොපැමිණීම හේතුවෙන් වසා දැමීමට සිදු විය. මෙම ගොඩනැගිල්ල අයිතිය පිළිබඳව නිවැරැදි තොරතුරක් සොයා ගැනීමට නොහැකි වීම හේතුවෙන් මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් මෙය භාර ගැනීමට එකග නොවිය. |
| (ආ) | බලංගොඩ විධායක ඉංජිනේරු කාර්යාලයට අයත් ලෙලන තලන යන්ත්‍රයේ ඇන්ජිම අළුත්වැඩියා නොකිරීම හේතුවෙන් වර්ෂ 05 කට වැඩි කාලයක සිටද ඇඹිලිපිටිය විධායක ඉංජිනේරු කාර්යාලයට අයත් ලෙලන තලන යන්ත්‍රය 2016 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණි. | අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනිමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | ඇඹිලිපිටිය විධායක ඉංජිනේරු කාර්යාලය සතු ZR 80 ලෙලන තලන යන්ත්‍රය ඉතා පැරණි මේ වන විට පාවිච්චියට ගත නොහැකි බැවින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ඉවත් කිරිමට හෝ වෙනත් ක්‍රියා මාර්ගයක් ගැනිම සඳහා කටයුතු |

| | | | |
|---|---|---|---|
| | | | කරමි. |
| (ඇ) | රඹුක්කන දිස්ත්‍රික් රෝහලට 2014 ඔක්තෝබර් 23 දින වෙනත් රෝහලක භාවිතා කරන ලද උපාංග සහිත එක්ස් කිරණ යන්ත්‍රයක් ලබා දී තිබුණ ද, එම යන්ත්‍රය ස්ථාපනය කිරීමට ගොඩනැගිල්ලක් හා විකිරණ ශිල්පියෙකු නොමැතිවීම හේතුවෙන් 2018 ඔක්තෝබර් 25 දින වන විටත් නිෂ්ක්‍රියව පැවතුණි. | නිෂ්ක්‍රීය වත්කම් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනිමට කටයුතු කළ යුතු යි. | වඩාත් ඉපැරණි මෙම යන්ත්‍රය අළුත්වැඩියා කිරිම සඳහා උපාංග නොමැති කමත් ඒ සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවන බැවින් පරික්ෂා කර බලා සුදුසු කටයුතු කරන ලෙසට රත්නපුර ජීව වෛද්‍ය ඒකකයට දන්වා යවන ලදි. යන්ත්‍රය අළුත්වැඩියා කළ හැකි තත්ත්වයක පවතින්නේ ද යන්න නියෝජිතායතනය විසින් පරික්ෂා කර බලා දැන්වීමෙන් අනතුරුව ඒ සම්බන්ධයෙන් ක්‍රියා කළ හැකි බව දන්වා සිටිමි. |
| (ඈ) | බලංගොඩ, කලවාන, කහවත්ත, ඇහැලියගොඩ, ඇඹිලිපිටිය රෝහල්වල වර්ග 6 ක යන්ත්‍ර ඒකක 10 ක් විවිධ හේතූන් නිසා මාස 04 සිට වර්ෂ 02 ක කාලයක් නිශ්කාර්යව පැවතුණි. මෙම ඒකකවල වටිනාකම දළ වශයෙන් රු.37,670,000 ක් විය. | රෝහල සතු සියළු වත්කම් උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව භාවිතයට ගැනීමට ක්‍රියාකළ කළ යුතු ය. | දන්ත x කිරණ යන්ත්‍රය භාවිතා කිරිම ඉදිරියේ දි කටයුතු කරන බව දන්වා ඇත. Auto clave යන්ත්‍ර ස්ථාපිත කිරිමට කටයුතු කරන බවත්, ඇඹිලිපිටිය රෝහලේ වෛද්‍ය උපකරණ ක්‍රියාත්මක කිරිමට තාක්ෂණික දැනුම සහිත නිලධාරියෙකු නොමැති බවත් දන්වා ඇත. බලංගොඩ රෝහලෙහි විදුලි ජනක ස්ථාපිත කිරීමට සුදුසු |

| | | | |
|---|---|---|---|
| | | | ක්‍රියාමාර්ගයක් ගන්නා බව දන්වා ඇත. |
| (ඉ) | වර්ෂ 13 ක පමණ කාලයක සිට නිෂ්කාර්යව පැවැතුණු පුස්සැල්ල ආයුර්වේද රෝහලෙහි ඇඹුරුම් යන්ත්‍ර දෙකක්, මිශ්‍ර කිරිමේ ටැංකිය හා විදුලි බොයිලේරුව භාවිතයට ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග හෝ විකල්ප ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | භාවිතයට ගත නොහැකි ලෙස හඳුනාගත් වත්කම් අපහරණය කිරිම හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතු වේ. | මෙම උපකරණ භාවිතයට ගත හැකි තත්වයේ නොමැති බැවින් එම උපකරණ වෙන්දේසි කිරීම සඳහා තක්සේරු වාර්තාවක් ලබා දීමට කටයුතු කරන ලෙස විධායක අධ්‍යක්ෂ,සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය වෙත ඉල්ලීම් කර ඇත . එම වාර්තාව ලැබීමෙන් පසු ප්‍රධාන අමාත්‍යාංශයේ උපදෙස් ලබා ගෙන ඒ සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කරමි. |

**5.7.2 බාහිර පාර්ශවයන් විසින් අත්පත් කරගෙන ඇති වත්කම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දිමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පෞද්ගලික මාර්ගයක් කහවත්ත මුලික රෝහල් භූමිය ඇතුළතින් පිහිටා තිබිම නිසා ඒ අසල පිහිටා තිබෙන රෝහලේ රසායනාගාර ගොඩනැගිල්ල හා ළමා වාට්ටුවට ආරක්ෂාව සම්බන්ධව ගැටළුකාරී තත්වයක් පැවතිණ. එසේ ම, රෝහලට අයත් ඉඩමෙන් කොටසක් බාහිර පාර්ශවයන් විසින් අත්පත් කරගෙන තිබුණ ද, එම දේපල නිරවුල් කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | රෝහල් ඉඩම නිරවුල් කර ප්‍රමාණවත් ආරක්ෂාවක් රෝහල් ගොඩනැගිලි සඳහා යෙදිය යුතු යි. | රෝහලට අයත් ඉඩම නිරවුල් කිරිම සඳහා මිනින්දෝරුවෙකු යොදවා පරික්ෂා කර කටයුතු සිදු කිරිමට නියමිත වේ. |
| (ආ) | පුස්සැල්ල ආයුර්වේද රෝහල් භූමියේ ප්‍රධාන පාරට මුහුණලා අනවසර ඉදිකිරීම් කර ඇති අතර, ඉඩමේ වැට මායිම් සකස් කර ඉඩම් ඔප්පුවක් හෝ | රෝහලේ දේපළ නිවැරදිව හඳුනාගෙන ලේඛනගතගත කළ යුතුය. | මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කර එම ගොඩනැගිල්ල |

| | | |
|---|---|---|
| වෙනත් බලපත්‍රයක් ලබාගෙන ඉඩමේ අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | ඉවත් කිරිමට කටයුතු කරදෙන ලෙස ඉල්ලා ඇති අතර, මෙම ඉඩම ඉදිරියේ දී මැනුම් කටයුතු කරන බව දන්වා ඇත. |

5.7.3 කාර්ය මණ්ඩල පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සබරගමු පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ නිලධාරින් 77 ක පුරප්පාඩුවක් පැවතිණි. එසේම වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පියෙකු නොමැති වීම හේතුවෙන් රත්නපුර ආයුර්වේද රෝහලේ වෛද්‍ය රසායනාගාරය 2015 වර්ෂයේ සිට වසා දමා තිබුණි. | පුරප්පාඩු වූ තනතුරු සඳහා සුදුසු නිලධාරින් බඳවා ගැනිමට කටයතු කළ යුතු යි. | අදාල නිළධාරීන් මෙම දෙපාර්තමේන්තුවට ලබා දෙන ලෙස දීර්ඝ කාලයක සිට මධ්‍යම රජයෙන් ඉල්ලීම් කර ඇත. |

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 6.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ර/කහවත්ත ප්‍රාථමික විද්‍යාලයේ විදුහල්පතිවරයාගේ මූල්‍ය වංචා සම්බන්ධයෙන් විගණන පරීක්ෂණ වාර්තාව අනුව වහාම රාජකාරි වැඩ තහනම් කර මූලික විමර්ශනයක් කිරිම හෝ චෝදනා පත්‍ර නිකුත් කරන ලෙස ප්‍රධාන ලේකම්ගේ 2018 අගෝස්තු 04 දිනැති ලිපිය මගින් අමාත්‍යාංශ ලේකම් වෙත දැනුම් දී තිබුණද මෙතෙක් ක්‍රියාත්මක කර නොතිබුණි. | ප්‍රධාන ලේකම්ගේ නිර්දේශයන් ක්‍රියාත්මක කළ යුතු යි. | ගරු ආණ්ඩුකාරතුමිය ගේ නියෝගය හා මූලික විමර්ශන කමිටුවේ අතුරු නිර්දේශ මත ර/කහවත්ත ප්‍රාථමික විද්‍යාලයේ විදුහල්පතිවරයාට ර/කුරුවිට මධ්‍ය මහ විද්‍යාලයට ස්ථානමාරුවක් ලබා දී ඇත. |

## 6.2 පාරිසරික හා සමාජ වගකීම් ඉටු කිරීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කිරිඇල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ මාසික වාර්තාවන්ට අනුව 2018 ඔක්තෝබර් මාසය වන විට අනාරක්ෂිත ළිං පාවිච්චි කරන නිවාස සංඛ්‍යාව 1972 ක් සහ සනීපාරක්ෂක වැසිකිළි රහිත නිවාස 07 ක් පැවතුණි. | අඩු ආදායම් ලාභින් සඳහා ප්‍රමාණවත් සනීපාරක්ෂන පහසුකම් සපයා දීමට ක්‍රියාකළ යුතුයි. | වැසිකිලි තනා ගැනිමට හා ළිඳ ආරක්ෂිතව තනා ගැනිමට වරින් වර උපදෙස් දෙනු ලබයි. |
| (ආ) | මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශ 03 ක මාසික වාර්තාවන් අනුව 2018 වර්ෂයේ දි අනාරක්ෂිත ළිං පාවිච්චි කරන නිවාස සංඛ්‍යාව 2336 ක්, වැසිකිළි නොමැති නිවාස 62 ක් , සනීපාරක්ෂක නොවන වැසිකිලි භාවිතා කරන නිවාස 48 ක් තිබුණි. | අඩු ආදායම් ලාභින් සඳහා ප්‍රමාණවත් සනීපාරක්ෂන පහසුකම් සපයා දීමට ක්‍රියාකළ යුතු යි. | වැසිකිලි නොමැති නිවාස වලට වැසිකිලි සැදිමට ආධාර දිමේ වැඩ පිළිවෙලක් මෙතෙක් සිදු නොවේ. ළිං නඩත්තු කිරිමට නිසි ක්‍රමවේදයක් නොමැත. පිරිසිදු පානිය නල ජලය ලබාදිම සිදු නොවන බැවින් අනාරක්ෂිත ළිං භාවිතය වැඩිවි ඇත. |

## 6.3 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සබරගමුව පළාත් සභාවේ වාර්ෂික සංවර්ධන සැලැස්ම යටතේ 2018 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සඳහා වෙන්කළ රු.මි.2,746 ක මුදල් තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට වෙන් කර තිබුණ ද ඉන් එක් අරමුණක් වන දේශගුණික විපර්යාස හා එහි බලපෑම්වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම සම්බන්ධ අරමුණු පළාත් සභාව විසින් හඳුනාගෙන නොතිබුණු අතර, හඳුනා ගෙන තිබූ අරමුණු 16 හි වැදගත් ඉලක්ක කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. 2018 වාර්ෂික සංවර්ධන සැලැස්ම යටතේ තිරසර සංවර්ධන ඉලක්කයන් ඉටුකර ගැනීමට අදාල ක්‍රියාකාරකම් ඉටුකර නොතිබුණි. | අදාල සැලසුම් සකස්කර ක්‍රියාත්මක කිරිමට කටයුතු කළ යුතුයි. | 2020 වර්ෂයේ සිට නිවැරදිව සැලසුම් ක්‍රියාත්මක කරමි. |